ඇසළ පෙරහැර භාරය - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 1.2.3 ජේදවල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 3(1) වගන්තිය යටතේ ඇසළ පෙරහැර භාරයේ පරිපාලන කටයුතු භාර වී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් මූල්‍ය ප්‍රකාශන සහතික කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කර තිබුණි.

(ආ) භාරය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබු අතර, ඒ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03ට අනුව උපචිත පදනම සහ විචක්ෂණභාවය සැලකිල්ලට ගෙන තිබුණි.ඒ යනුවෙන් වැඩිදුරටත් දක්වා තිබුණි. නමුත් 2010 ජනවාරි 19 දිනැති අංක PED 54 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSA) කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂය සඳහා වූ ස්ථාවර තැන්පත් පොලී අදායම වු රු.90,493 ක් ලද පොලී ආදායම් හා ලැබිය යුතු තැන්පත් පොලි ආදායම් ලෙස දෙවරක් සටහන් කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද, ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද පෙන්නුම් කර තිබුණි.

(ආ) භාරය සතු ඇත් තටාකාංගනයේ වටිනාකම රු.73,350ක් වුවත්, ක්ෂය කළ පසු අගය ශුන්‍ය වී තිබුණත්, එය ප්‍රත්‍යාගණනය කර වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඇසළ පෙරහැර භාරය විසින් ප්‍රමුඛ බැංකුවේ තැන්පත් කරන ලද රු.20,000,000ක මුදල බැංකුව වැසා යාමත් සමඟ 2002 වර්ෂයේ දී මහ බැංකුවට පවරා ගෙන මහා භාරකරු වෙත නිදහස් කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල මහා භාරකරුගෙන් ලැබිය යුතු මුදලක් ලෙස සලකා ගිණුම්ගත කිරීමකින් තොරව තවදුරටත් එකී මුදල ආයෝජන යටතේ දක්වා තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම්

------------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පහත සඳහන් ගිණුම් විෂයයන් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවු සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 98,600 | ස්ථාවර වත්කම් ලේඛනය |
| කාර්ය මණ්ඩල ගෙවීම් හා මාසික දීමනා | 232,000 | පෙරහැර රාජකාර් පැවරීම පිළිබඳ විස්තර |
| සතර දේවාල සඳහා ආධාර | 1,500,000 | ආධාර ලබා ගත් බවට කුවිතාන්සි |

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සඳහා දීමනා | 50,000 | දීමනා ගෙවීම මගින් සලසන ලද සේවා පිළිබඳ විස්තර |

1.2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනත | |
| 19 වන වගන්තිය | ආසන පැනවීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරිය ඇතිව මිස අන්‍යාකාරයකින් ගාසතුවක් අය කිරීම නොකළ යුතු වුවද, පෙරහැර ආසන 5181ක් පැනවීම වෙනුවෙන් විධිමත්ව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ. 267(1) | කාර්ය මණ්ඩල දීමනා සහ සම්මාන ලාභී දීමනා ලෙස ගෙවා තිබුණු රු.33,500කට අදාළ මුදල් ලද බවට කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. |
| (ii) මු.රෙ.756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌනතාවය රු.10,738ක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,285,005 ක් වයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,295,743 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ පෙරහැර නැරඹීම සඳහා ආසන පැනවීම වෙනුවෙන් ලද ආදායම රු. 1,122,850 කින් අඩුවීම එම පිරිහීමට විශේෂයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇසළ පෙරහැරෙහි සම්මානලාභී ශිල්පීන් තෝරා ගැනීම සඳහා පත් කරන ලද විනිශ්චය මණ්ඩලය විසින් අවස්ථා 3ක් යටතේ සම්මානලාභීන් 40 දෙනෙකු තෝරා ගෙන තිබුණත්, එම ශිල්පීන් සම්මාන ලැබීමට සුදුසු බවට විනිශ්චය මණ්ඩලය විසින් නිර්දේශ කර අත්සන් තබා නොතිබුණි. මේ නිසා පිරිනමන ලද රු.325,000ක ත්‍යාග මුදල් ලබාදීම නිසි පරිදි නිර්දේශ නොකිරීම මගින් විනිශ්චය මණ්ඩලයේ කාර්යය විධිමත් පරිදි ඉටුකර නොතිබුණි.

(ආ) ඇසළ පෙරහැර පවත්වනු ලබන කාලසීමාව තුළ නිර්වින්දන වෛද්‍ය සේවාව ලබා ගැනීම සඳහා කිසිදු ගිවිසුමකින් තොරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ නමින් රු.50,000 ක චෙක්පතක් නිකුත් කර තිබුණු අතර, ඊට අමතරව ඔහුට හා ඔහුගේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු.64,000 ක් ද ගෙවා තිබුණි. පෙරහැර පවත්වාගෙන යාමේදී අත්‍යාවශ්‍ය සේවාවක් වු නිර්වින්දන කාර්ය මණ්ඩලය ලබා ගැනීමට සමගාමීව නිර්වින්දන ඖෂධ ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අලි ඇතුන් නිර්වින්දනය කිරීම උදෙසා ඖෂධ ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවු බැවින් රු.114,000 ක නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

3.2 හඳුනාගන්නා ලද පාඩු

භාරය සතුව පැවැති රු.20,000,000 ක මුදලක් පෞද්ගලික බැංකුවක ආයෝජනය කිරීම හේතුවෙන් 2002 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ගණන් බලන ලද වෙළඳපල පොලිය සහ මහා භාරකරුගෙන් එක් එක් වර්ෂවල ලබා දෙන ලද මුදල් ගැලපීමෙන් පසු රු.932,000 ක ආදායමක් භාරය වෙත අහිමි වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී තථ්‍ය ආදායම රු.442,850 ක් ව තිබියදී සමාලෝචිත වර්ෂයේ එම ආදායම රු.250,000 ක් ලෙස එනම් සියයට 44ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) පූර්ව වැය ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී නිර්වින්දන කාර්ය මණ්ඩලය සඳහා රු.114,000 ක වියදමක් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වු ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේ දී වැය විෂයයන් 03 ක සියයට 17 සිට සියයට 100 දක්වා වු පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර නිකුත් කරන ලද විගණන විමසුම් මගින් භාරකාර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සදහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය පාලනය

(ආ) ආදායම් රැස් කිරීම

(ඇ) ආයෝජනය

(ඈ) ගිණුම්කරණය